# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1711/29 - 2011 ජුනි 25 වැනි සෙනසුරාදා - 2011.06.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ කොට්කාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

මිය යාම හේතු කොට ගෙන කොට්කාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ සභිකයෙකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

කලුතන්ත්‍රිගේ කේමතිස්ස නම් වූ සභිකයා අයත්වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ, පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත් කරගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ඒ පක්ෂයට අයත් ඒ කොට්කාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට ඉහත කී ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු වන තිලකමුනි අජිත් ගුණසේකර සොයිසා මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

කොට්කාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී ජයසිංහ ආරච්චිල්ලාගේ සමන්ත ප්‍රියලීල් ජයසිංහ වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, තිලකමුනි අජිත් ගුණසේකර සොයිසා මහතා කොට්කාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ජේ. ඒ. එස්. පී. ජයසිංහ,
තේරීම්භාර නිලධාරී,
කොට්කාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව.

2011 ජුනි මස 20 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කොළඹ.

07 - 273

1A - G 14709 — 345 (2011/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.